ET/SSS/2022(2023)/OL/50/S/Q/S-2

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

G. C. E. Ordinary Level | අ. පො. ස. සාමාන්‍ය පෙළ | 2022 (2023)

# Student Seminar Series

# ශිෂ්‍ය සම්මන්ත්‍රණ මාලාව

Practice Paper | උපකාරක ප්‍රශ්න පත්‍ර

# Drama & Theatre

# නාට්‍ය හා රංග කලාව



Question Paper - I, II | ප්‍රශ්න පත්‍රය - I, II (සිංහල මාධ්‍යය)

මෙහෙයවීම : දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන ශාඛාව | අන්තර්ගතය : සෞන්දර්යය අධ්‍යාපන ශාඛාව

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
**Ministry of Education, Sri Lanka**

**50 | S | I, II**

අ. පො. ස. සාමාන්‍ය පෙළ විභාගය - ශිෂ්‍ය සම්මන්ත්‍රණ මාලාව - 2022 (2023)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை- மாணவர் கருத்தரங்கு தொடர் - 2022 (2023)
**G. C. E. Ordinary Level Examination – Student Seminar Series**

නාට්‍ය හා රංග කලාව I, II
நாடகமும் அரங்கியவும் I, II
**Drama & Theatre I, II**

පැය තුනයි.
மூன்று மணித்தியாலம்
Three Hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි.
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time – 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.

**නාට්‍ය හා රංග කලාව (සිංහල) I**

**සැලකිය යුතුයි:**
* **සියලු ම** ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
* අංක **1** සිට **40** තෙක් ප්‍රශ්න වල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.
* **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X ) ලකුණ යොදන්න.**

- **පහත දැක්වෙන පද්‍ය පාඨ ඇසුරින් අංක 1 සිට 5 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

(A) උගෙ කාරිය ඌ පැලපොල් වනසනවා
මගෙ කාරිය මම පැලපොල් සිටුවනවා
සිතු කාරිය සිතුදේ සාදා දෙනවා
උඩු වේරිය දෙවි ඌරට හෙන දෙනවා

(B) නැතක් බලති දොළසක් දෙවියන් නමට
කොතෙක් පාලි කෙරුවත් නැත සිත සතුට
මෙතෙක් කර දොළස ආතුර රැකීමට
ඇතෙක් සොයා බැඳලා දෙමි පඬුරකට

(C) ජටා හිස දරමින - ශුද්ධ අෂ්ටක වැල් ද කරලන
කුඩය ගෙන සුරතින - මෙසේ බමුණෙක් සබේ නික්මුන

(D) උඩින් උඩින් උඩු ගුවනින් ගෙනාවා
බිමින් බිමින් බිම් තැන්නෙන් ගෙනාවා
කපා කොටා ලියවාලා ගෙනාවා
රිද්දි බිසව් හිස පීරන පනාවා

(E) අන්දම් කරුවලේ සොහොනේ සිටින්නේ
අන්දමකින් රෑ සිහිනෙන් පෙනෙන්නේ
රන්දම් යගදාව ගෙන කරකවන්නේ
පන්දම් පාලියට සන්නිය වරෙන්නේ

01. සූනියම් යාගය ශාන්තිකර්මය හා සම්බන්ධ කවිය වන්නේ,
1) A ය. 2) B ය. 3) C ය. 4) D ය.

02. කොහොඹා කංකාරිය ශාන්තිකර්මය හා සම්බන්ධ වන්නේ,
1) A ය. 2) B ය. 3) C ය. 4) E ය.

03. සන්නි යකුම ශාන්තිකර්මය හා සම්බන්ධ වන්නේ,
1) B ය. 2) C ය. 3) D ය. 4) E ය.

04. මඩු ශාන්තිකර්මය හා සම්බන්ධ වන්නේ,
1) B ය. 2) C ය. 3) D ය. 4) E ය.

05. රටයකුම ශාන්තිකර්මය හා සම්බන්ධ වන්නේ,
1) A ය. 2) B ය. 3) D ය. 4) E ය.

- **නිවැරදි පිළිතුර තෝරන්න.**

06. චරිත නිරූපණයක දී වඩාත් ම සැලකිලිමත් විය යුත්තේ,
1) රංග වස්ත්‍ර හා අංග රචනය පිළිබඳව ය.
2) අභිනය හා සංවාද භාවිතය පිළිබඳව ය.
3) රංග භූමිය හා ආලෝකකරණය පිළිබඳව ය.
4) බාහිර පෙනුම සහ කටහඬ පිළිබඳව ය.

07. වඩාත් ගැළපෙන සම්බන්ධතාවක් දැක්වෙන පිළිතුර තෝරන්න.
1) මුද්‍රා නාට්‍ය - ප්‍රේමසිරි කේමදාස 2) ගීත නාට්‍ය - දයානන්ද ගුණවර්ධන
3) ඔපෙරා - මිරන්ඩා හේමලතා 4) බැලේ - චයිකොව්ස්කි

08. සංවාද භාවිතයේ දී වඩාත් සැලකිලිමත් විය යුතු කරුණ වන්නේ ,
1) තීව්‍ර හඬින් සංවාද උච්චාරණය කිරීම.
2) රිද්මයානුකූලව සංවාද උච්චාරණය කිරීම.
3) සංවාදවල ජීව ගුණය රැකීම.
4) විවිධ උච්චාරණ වීධීන් භාවිත කිරීම.

09. පහත දැක්වෙන පිළිතුරු අතරින් ප්‍රාසංගික කලාවක් වන්නේ,
01. ඔපෙරා 02. කාටූන්
03. චිත්‍රපට 04. රූපවාහිනී නාට්‍ය

10. නාට්‍ය සංගීතය නිර්මාණය කිරීමේ දී,
1) සජීවී සංගීතය පමණක් භාවිත කළ යුතු ය.
2) නාට්‍යයේ තේමාවට උචිත විය යුතු ය.
3) රංගය අබිබවා යා යුතු ය.
4) නාට්‍යයේ විචිත්‍රත්වය මූලික අරමුණ විය යුතු ය.

11. අභිරූපණ ශිල්පියා,
1) චරිත ස්වභාවය ඉස්මතු වන පරිදි රංග වස්ත්‍ර භාවිත කරයි.
2) අතිශයෝක්තියෙන් සහ රිද්මයානුකූලව චලන භාවිත කරයි.
3) රංග භාණ්ඩ භාවිත කරයි.
4) චරිත ස්වභාවය ඉස්මතු වන පරිදි අංග රචනය යොදා ගනී.

12. වේදිකා නාට්‍යයක රංගාලෝක නිර්මාණය පිළිබඳ විස්තර ඇතුළත් වන්නේ,
1) ආලෝක පාලන පුවරුවෙහි ය. 2) නාට්‍ය පිටපතෙහි ය.
3) නිෂ්පාදන පිටපතෙහි ය. 4) ආලෝක සැලසුම්පතෙහි ය.

13. මුහුණේ හෝ ශරීරයේ ඇතැම් තැන්වල විවිධ හැඩ සැකසීම සඳහා භාවිත කරන අංග රචනා ද්‍රව්‍ය වන්නේ,
1) පැන් කේක් 2) වුත් එනමල්
3) මේකප් පෙන්සිල්ස් 4) නෝස් පොටි

14. දයානන්ද ගුණවර්ධනයන්ගේ 'බක් මහ අකුණු' නාට්‍යය සඳහා යොදා ගත් සුවිශේෂී රංග භූමි භාවිතයක් වන්නේ,
1) එරිනා වේදිකාව 2) එළිමහන් වේදිකාව
3) කැරකෙන වේදිකාව 4) ප්‍රොසීනියම් වේදිකාව

15. රෝමෝද්ගමනය, ඇඟ වෙව්ලීම, කටහඬ වෙනස් වීම ආදිය අයත් වන්නේ,
1) ආංගික අභිනයට ය.
2) සාත්ත්වික අභිනයට ය.
3) ආහාර්ය අභිනයට ය.
4) වාචික අභිනයට ය.

- **පහත දැක්වෙන වගුව ඇසුරින් අංක 16 සිට 20 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

| මුල් කෘතිය | රචකයා | අනුවර්තන කෘතිය | අනුවර්තකයා |
|---|---|---|---|
| ද ග්ලාස් මෙනාජරි | ටෙනිසි විලියම්ස් | **'A'** | හෙන්රි ජයසේන |
| ද රෙස්පෙක්ටබල් ප්‍රොස්ටිටියුට් | **'B'** | නම්බුකාර අභිසරු ලිය | උදය මල්ලවාරච්චි |
| ද මැරේජ් | නිකොලායි ගොගොල් | කපුවා කපෝති | **'C'** |
| **'D'** | රේ කුනි | රෝමය ගිනි ගනී | බන්දුල විතානගේ |
| සික්ස් කැරැක්ටර්ස් ඉන් සර්ච් ඔෆ් ඇන් ඕතර් | ලුයිජි පිරන්ඩෙලෝ | **'E'** | සුගතපාල ද සිල්වා |

16. ඉහත වගුවේ **'A'** කොටුවට ඇතුළත් විය යුතු අනුවර්තන කෘතිය වන්නේ,
1) හිත හොඳ අම්මණ්ඩි 2) අහස් මාළිගා
3) සකලජන 4) වෙස් මුහුණු

17. ඉහත වගුවේ **'B'** කොටුවට ඇතුළත් විය යුතු රචකයාගේ නම වන්නේ,
1) රේ කුනී 2) නිකොලායි ගොගොල්
3) ඇන්ටන් චෙකොව් 4) ෂෝන් පෝල් සාත්‍රෙ

18. ඉහත වගුවේ **'C'** කොටුවට ඇතුළත් විය යුතු අනුවර්තකයාගේ නම වන්නේ,
1) ඊ.ආර්. සරච්චන්ද්‍ර 2) රංජිත් ධර්මකීර්ති 3) විජිත ගුණරත්න 4) සුගතපාල ද සිල්වා

19. ඉහත වගුවේ **'E'** කොටුවට ඇතුළත් විය යුතු අනුවර්තන කෘතියේ නම වන්නේ,
1) හිත හොඳ අම්මණ්ඩි 2) හරිම බඩු හයක්
3) බෙරහඬ 4) මූදු පුත්තු

20. ඉහත වගුවේ **'D'** කොටුවට ඇතුළත් විය යුතු මුල් කෘතියේ නම වන්නේ,
1) යෙර්මා 2) ඉක්නෙච්ටාඉ
3) රන් ෆෝර් යුවර් වයිෆ් 4) ද ප්‍රොපෝසල්

- **පහත දැක්වෙන ඡායාරූප ඇසුරෙන් 21 සිට 25 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

| | | | | |
|---|---|---|---|---|
|  |  |  |  |  |
| **(A)** | **(B)** | **(C)** | **(D)** | **(E)** |

21. වීදි නාට්‍ය සඳහා රංගනයෙන් දායක වූ ශිල්පියා/ශිල්පිනිය දැක්වෙන රූපය වන්නේ,
   1) ‘A’ ය. 2) ‘B’ ය. 3) ‘C’ ය. 4) ‘D’ ය.

22. රතු හැට්ටකාරී නාට්‍යයේ රංගනයෙන් දායක වූ ශිල්පියා/ශිල්පිනිය දැක්වෙන රූපය වන්නේ,
   1) ‘A’ ය. 2) ‘B’ ය. 3) ‘C’ ය. 4) ‘D’ ය.

23. ‘අජාසත්ත’ නාට්‍යයේ රංගනයෙන් දායක වූ ශිල්පියා/ශිල්පිනිය දැක්වෙන රූපය වන්නේ,
   1) ‘A’ ය. 2) ‘B’ ය. 3) ‘C’ ය. 4) ‘E’ ය.

24. ඉංග්‍රීසි නාට්‍ය නිර්මාණ බොහෝ සංඛ්‍යාවක් සඳහා දායක වූ ශිල්පියා/ශිල්පිනිය දැක්වෙන රූපය වන්නේ,
   1) ‘A’ ය. 2) ‘B’ ය. 3) ‘D’ ය. 4) ‘E’ ය.

25. ‘ගජමන් පුවත’ නාට්‍ය නිර්මාණය සඳහා දායක වූ ශිල්පියා/ශිල්පිනිය දැක්වෙන රූපය වන්නේ,
   1) ‘B’ ය. 2) ‘C’ ය. 3) ‘D’ ය. 4) ‘E’ ය.

- පහත දැක්වෙන වෙස් මුහුණු දෙක ආශ්‍රයෙන් 26 සහ 27 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



(A)



(B)

26. ඉහත ‘A’ සහ ‘B’ වෙස් මුහුණු පිළිබඳ සත්‍ය ප්‍රකාශය වන්නේ,
   1) ‘A’ සන්නි මුහුණකි.‘B’ කෝලම් මුහුණකි. 2) ‘A’ කෝලම් මුහුණකි.‘B’ සන්නි මුහුණකි.
   3) ‘A’ සහ ‘B’ දෙක ම සන්නි මුහුණු දෙකකි. 4) ‘A’ සහ ‘B’ දෙක ම කෝලම් මුහුණු දෙකකි.

27. ඉහත ‘A’ සහ ‘B’ වෙස් මුහුණු පිළිවෙළින් දැක්වෙන්නේ,
   1) මුදලි කෝලම, දෙමළ සන්නිය 2) මුදලි කෝලම, ගිනිජල් සන්නිය
   3) ආරච්චි කෝලම, දෙමළ සන්නිය 4) ආරච්චි කෝලම, කණ සන්නිය

28. කෙටි නාට්‍යයක ලක්ෂණයක් **නොවන්නේ,**
   1) සීමිත කාලයක් තුළ දිවෙන සිදුවීමක් වීම 2) සුවිශේෂී සංගීත භාවිතයක් තිබීම
   3) එක අංකයකට සීමා වීම 4) චරිත ප්‍රමාණය අවම වීම

29. ශාරීරික අභ්‍යාසවලින් අපේක්ෂිත අරමුණක් **නොවන්නේ,**

1) රූපණ ක්‍රියාවලියේ දී හඬ පෞරුෂය දියුණු වීම 2) ශාරීරික ක්‍රියාශීලීභාවය වර්ධනය කිරීම

3) ශාරීරික නම්‍යශීලීතාව ඇති කිරීම 4) සබකෝලය නැති වීම

30. වේෂභූෂණ ශිල්පියාගේ කාර්ය හා සම්බන්ධ **නොවන්නේ,**

1) පිටපතෙහි සඳහන් කාලය, යුගය සහ දේශයට ගැළපීම.

2) චරිතයට ගැළපෙන අයුරින් වේෂභූෂණ යොදා ගැනීම.

3) සෙසු ආනුෂංගික කලාවන්ගේ වර්ණ සමග ගැලපීම.

4) රූපණ ශිල්පියාගේ අභිමත පරිදි වර්ණ තෝරා ගැනීම.

- **පහත දැක්වෙන තොරතුරු ඇසුරෙන් අංක 31 සිට 35 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

| | |
|---|---|
| A - නානුමුරය | F - වඩිග පටුන |
| B - පැදුරේ දැපවිල්ල | G - වැදි යක්කම |
| C - කපු යක්කාරිය | H - රාමා මැරීම |
| D - ගබඩා කොල්ලය | I - දෙවොල් ගොඩ බැසීම |
| E - අඹ විදමන | J - සූනියම් යක්ෂණියගේ පැමිණීම |

31. කාන්තාවන් වෙනුවෙන් ම පවත්වන පහතරට ශාන්තිකර්මයක නාට්‍යමය පෙළපාලි වන්නේ,
1) A සහ C ය. 2) A සහ D ය. 3) C සහ J ය. 4) E සහ J ය.

32. අණවින, කොඩිවින ආදිය දුරු කිරීමට පවත්වන ශාන්තිකර්මයක නාට්‍යමය පෙළපාලියක් වන්නේ,
1) D ය. 2) I ය. 3) F ය. 4) B ය.

33. උඩරට ප්‍රදේශවල පවත්වන ප්‍රධාන ශාන්තිකර්මයට අයත් අන්තර් රංග අවස්ථා වන්නේ,
1) E සහ G ය. 2) D සහ I ය. 3) B සහ F ය. 4) D සහ G ය.

34. පහතරට ශාන්ති කර්මයක පත්තිනි දේවියගේ උපත හා සම්බන්ධ අන්තර් රංග අවස්ථාවක් වන්නේ,
1) C ය. 2) E ය. 3) I ය. 4) H ය.

35. ඇඳුරන් කාන්තා චරිත ලෙස සමාරෝපය වී ඉදිරිපත් කරන අන්තර් රංග අවස්ථා වන්නේ,
1) A, C සහ I ය. 2) A, C සහ E ය. 3) A, C සහ J ය. 4) C, E සහ J ය.

36. විකෘති නාට්‍යය සඳහා බර්ටෝල්ට් බ්‍රෙෂ්ට්ගේ රංග ශෛලියෙන් උපුටා ගත් ලක්ෂණයක් ලෙස සැලකිය හැක්කේ,
1) එක් දිනක් ඇතුළත කතාවේ සියලු සිදුවීම් ගොනු වීම
2) අදහස් ප්‍රකාශනය සඳහා අවම වශයෙන් ගීත යොදා ගැනීම
3) වේදිකා පසුතල අවම වීම සහ සංකේත යොදා ගැනීම
4) නාට්‍ය ආරම්භයේ දී තිරය වසා තැබීම.

37. කැරොල් ගායනා අන්තර්ගත සංස්කෘතික උත්සවය වන්නේ,
1. හජ්ජි ය. 2. රාමසාන් ය.
3. දීපවාලී ය. 4. නත්තල් ය.

38. ප්‍රකට රංග වින්‍යාස නිර්මාණ ශිල්පියෙක් වන්නේ,
   1) ජෙරොම් ඩි. සිල්වා ය.
   2) සාලමන් ෆොන්සේකා ය.
   3) පරාක්‍රම නිරිඇල්ල ය.
   4) පණීභාරත ය.

39. කඩවුණු පොරොන්දුව, පෙරළෙන ඉරණම, ***** වැරදුණු කුරුමානම යන නිර්මාණ අයත් නාට්‍ය කලාව වන්නේ,
   1) මිනර්වා නාට්‍ය වේ.
   2) ටීටර් නාට්‍ය වේ.
   3) නූර්ති නාට්‍ය වේ.
   4) නාඩගම් නාට්‍ය වේ.

40. ‘සොඳුරු ආඥාදායකයා හෙවත් නාට්‍ය නිෂ්පාදක’ කෘතිය රචනා කරන ලද්දේ,
   1) හෙන්රි ජයසේන ය.
   2) සයිමන් නවගත්තේගම ය.
   3) සුගතපාල ද සිල්වා ය.
   4) මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර ය.

*****

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education, Sri Lanka

| 50 | S | I, II |
|---|---|---|

| | |
|---|---|
| නාට්‍ය හා රංග කලාව | I, II |
| நாடகமும் அரங்கியலும் | I, II |
| Drama & Theatre | I, II |

අ. පො. ස. සාමාන්‍ය පෙළ විභාගය - උපකාරක සම්මන්ත්‍රණ මාලාව - 2022 (2023)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை- ஆதரவு கருத்தரங்கு தொடர்- 2022 (2023)
G. C. E. Ordinary Level Examination - Support Seminar Series - 2022 (2023)

නාට්‍ය හා රංග කලාව (සිංහල) II

- පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළුව ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න

01) දික්තල කාලගෝල නාට්‍යය ඇසුරෙන් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

I. දික්තල කාලගෝල නාට්‍යයට පාදක කර ගත් ග්‍රන්ථය හා ජාතක කතාව කුමක්ද? (ලකුණු 02)

II. නාට්‍යයේ ප්‍රධාන ගැටුම ඇතිවන්නේ කවුරුන් අතර ද? (ලකුණු 02)

III. දික්පිටියා මහෞෂධ පඬිතුමා ඉදිරියේ දික්තලාගේ නම ලෙස දක්වන ව්‍යාජ නම කුමක් ද? (ලකුණු 02)

IV. නාට්‍යයෙන් ඉස්මතු වන මහෞෂධ පඬිතුමාගේ චරිත ලක්ෂණයක් ලියන්න. (ලකුණු.02)

V. නාට්‍යයේ පසුතල හා ස්ථාන මැවීමට නාට්‍යකරුවා යොදා ඇති උපක්‍රම දෙකක් ලියන්න. (ලකුණු 02)

VI. ජාතක කතාවෙන් නාට්‍යය වෙනස් වන අවස්ථා දෙකක් ලියන්න. (ලකුණු 02)

02) (i) සන්නි යකුම පැවැත්වීමේ අරමුණු දෙකක් ලියන්න. (ලකුණු 02)

(ii) සන්නි යකුමේ උපත් කතාව කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04)

(iii) සන්නි යකුමේ අන්තර් රංග අවස්ථාවක් නම් කර, එහි දක්නට ලැබෙන නාට්‍යමය ලක්ෂණ හතරක් විස්තර කරන්න. (ලකුණු 06)

03) (i) රංගාලෝක පහනක් හා උපකරණයක් නම් කරන්න. (ලකුණු 02)

(ii) රංගාලෝකය අතීතයේ සිට අද දක්වා දියුණු වූ ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(iii) නාට්‍යයකට රංගාලෝකයෙන් ඉටුකර ගනු ලබන සුවිශේෂ කාර්යයන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

04) (i) මිනර්වා නාට්‍යයේ පුරෝගාමී නාට්‍යකරුවා නම් කරන්න. (ලකුණු 02)

(ii) ලංකාවේ වේදිකා නාට්‍යකලාවේ අනුවර්තන නාට්‍යකරුවෙක් හා පරිවර්තන නාට්‍යකරුවෙක් බැගින් නම් කර, ඔවුන්ගේ අනුවර්තන හා පරිවර්තන නිර්මාණ එක බැගින් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) අනුවර්තන, පරිවර්තන හා ස්වතන්ත්‍ර නාට්‍ය එකිනෙකට වෙනස් වන්නේ කෙසේදැයි විස්තර කරන්න. (ලකුණු 06)

05) (i) ප්‍රධාන රංගභූමි වර්ග දෙක නම් කරන්න. (ලකුණු 02)

(ii) මනඃකල්පිත භූගෝලීය බෙදීමකට අනුව ප්‍රොසීනියම් රංග භූමිය කොටස් කීයකට බෙදා වෙන් කෙරේ ද? එය ඇඳ දක්වන්න. (ලකුණු 04)

(iii) රංග භූමිය ප්‍රායෝගිකව භාවිත කිරීමේ දී අවධානය යොමු කළ යුතු කරුණු පැහැදිලි කරන්න. (ලකුණු 06)

06) (i) ජනකරළිය රංග ආයතනය නිර්මාණය කළ නිර්මාණකරුවා නම් කරන්න. (ලකුණු.02)

(ii) එම නිර්මාණකරුගේ නාට්‍ය නිර්මාණ හතරක් නම් කරන්න. (ලකුණු.04)

(iii) ඔහුගෙන් ලාංකේය නාට්‍ය ක්ෂේත්‍රයට සිදු වූ සේවාව පැහැදිලි කරන්න. (ලකුණු.06)

07) පහත දැක්වෙන කතා සාරාංශය පදනම් කර ගෙන නාට්‍යෝචිත අවස්ථාවක් ගොඩනැගෙන පරිදි නාට්‍ය පෙළක් රචනා කරන්න. ඔබට කැමති පරිදි චරිතවල පුද්ගල නාම, ස්ත්‍රී පුරුෂ බව හෝ චරිත සංඛ්‍යාව වෙනස් කර ගත හැකි ය.

පැතුම් අවුරුදු විසි දෙකක තරුණයෙකි. ඔහු සම්මුඛ පරීක්ෂණයකට යාමට සූදානම්ව සිටිය දී, හැකි ඉක්මනින් රෝහලට පැමිණෙන ලෙස හදිසි පණිවුඩයක් ලැබෙයි. ඔහු කඩිමුඩියේ රෝහලට ගොස් බලන විට.....

(i) පසුබිම, කාලය හා චරිත මැවීමට අවශ්‍ය පරිදි රංග විධාන සමග සංවාද රචනා කිරීම සඳහා (ලකුණු.04)

(ii) චරිත අතර ගැටුමක් ඇතිවන අයුරින් අවස්ථාව ගොඩ නැගීම සඳහා (ලකුණු.04)

(iii) කුතුහලය සහ චරිතයක නොසිතූ පෙරළියක් සහිත නාට්‍යෝචිත අවස්ථාවක් නිර්මාණය කිරීම සඳහා (ලකුණු.04)

*****